# විශ්වවිද්‍යාල සිසුන් ඉංග්‍රීසි පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවණතාවය (කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨය ඇසුරින්)

ජී. ඒ. එස්. මධුවන්ති[1]

**සංක්ෂේපය**

වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ ඉංග්‍රීසි භාෂාව සඳහා හිමිවන්නේ වැදගත් ස්ථානයකි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන සිසුන් සඳහා එම විශ්වවිද්‍යාල මගින් ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අතරින් ඉංග්‍රීසි භාෂා පාඨමාලා පැවැත්වීම, ඉංග්‍රීසි මාධ්‍යයෙන් යම් විෂය ඒකකයන් ඉගැන්වීම ආදිය මඟින් සිසුන්ගේ ඉංග්‍රීසි භාෂාව ඉහළ නැංවීමට කටයුතු සූදානම් කර ඇත. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන සිසුන් ඉංග්‍රීසි පාඨමාලාවලට සහභාගි වීමේ ප්‍රවණතාවය පිළිබඳ සෙවීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මෙම අධ්‍යයන සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාථමික දත්ත යොදාගත් අතර, කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ අධ්‍යයන වර්ෂ 4 නියෝජනය වන පරිදි සිසුන් 100 කින් යුත් සසම්භාවී නියැදියක් යොදා ගන්නා ලදී. අධ්‍යයන සඳහා ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් දත්ත රැස් කරගත් අතර, මීට අමතරව ද්විතීයික මූලාශ්‍ර ලෙස සඟරා, අන්තර්ජාලය ඇසුරින් දත්ත ලබාගන්නා ලදී. දත්ත ඉදිරිපත් කිරීම වගු, ප්‍රස්තාර ආදිය මගින් සිදු කළ අතර, දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම භාවිත කරන ලදී. විශේෂයෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ සිසුන්ගෙන් 43% ක්ම මෙම ඉංග්‍රීසි පාඨමාලා සඳහා යොමුවන අතර, 57% ක් ඉංග්‍රීසි පාඨමාලා සඳහා යොමු නොවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. එයින් ප්‍රථම වසර සිසුන්ගෙන් 72% ක් ද, දෙවන වසර සිසුන්ගෙන් 48% ක්ද, තෙවන වසර සිසුන්ගෙන් 32% ක්ද, සිව්වන වසර සිසුන්ගෙන් 20 % ක්ද ඉංග්‍රීසි පාඨමාලා සඳහා සහභාගි වීම දක්නට ලැබේ. මෙසේ ඉංග්‍රීසි පාඨමාලාවලට සහභාගි වීම අඩු ප්‍රතිශතයක් පැවතීමට හේතු ලෙස ඉංග්‍රීසි පාඨමාලා සඳහා කාලය වෙන් කරගත නොහැකි වීම, අධ්‍යයන කටයුතු සමඟ වෙනත් පාඨමාලා හැදෑරීමට ඉඩකඩක් නොමැතිකම, විශ්වවිද්‍යාල අධ්‍යාපනයට පෙර ඉංග්‍රීසි පාඨමාලා හදාරා තිබීම, ඉංග්‍රීසි පාඨමාලා හැදෑරීම නොසලකා හැරිම ආදි කරුණු දැක්විය හැකිය. මෙම අධ්‍යයනයෙන් නිගමනය කළ හැක්කේ, විශ්වවිද්‍යාලය තුළ අධ්‍යාපනය ලබන සිසුන් එම විශ්වවිද්‍යාල මඟින් පවත්වනු ලබන ඉංග්‍රීසි පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවණතාවය අඩු බවයි. විශේෂයෙන්ම යම් විෂය මාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වීම හේතු කොටගෙන ඉංග්‍රීසි භාෂා පාඨමාලා අනිවාර්ය කළ යුතු බව මේ සඳහා යෝජනා කළ හැකි අතර, එමඟින් විශ්වවිද්‍යාල සිසුන් තුළ ඉංග්‍රීසි දැනුම වර්ධනය වීම ද අපේක්ෂා කළ හැකිය.

**මුඛ්‍ය පද :** විශ්වවිද්‍යාල සිසුන්, ඉංග්‍රීසි භාෂාව, ඉංග්‍රීසි පාඨමාලා

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sachithra731@gmail.com